# මුල්ගිරිගල රජමහා විහාරය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්.

***එච්.කේ හර්ෂා සුභාෂිණී.***

***උදා හෙට්ටිගේ***

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවෙහි බෞද්ධාගමික පුනරුදය ක්‍රිස්තු පූර්ව 3 වන සියවසේදී එනම් මිහිඳු හිමියන් සහ සංඝමිත්තා තෙරණිය බුදුදහම වැඩම වීමත් සමඟ ආරම්භ වූ අතර ඉන්පසු රට පුරා බෞද්ධාගමික කේන්ද්‍රස්ථානයන් බිහිවිය. මෙලෙස බිහි වූ බෞද්ධාගමික මධ්‍යස්ථානන් අතර පහතරට දකුණු පළාතේ පිහිටි මුලගිරි විහාරය ප්‍රධාන ස්ථානයක් ගනී. දේවානම් පියතිස්ස රජු දවස දෙතිස්ඵල බෝධිවෘක්ෂ රෝපණයෙන් ආරම්භ වූ මෙම විහාරය පසු කාලීනව රාජ්‍ය පාලනය කළ පාලකවරුන්ගේ දායකත්වය මත වත්මනය දක්වා නොනැසී අඛණ්ඩව ක්‍රියාකාරී සන්දර්භයක් ලෙස පැවත ඇත. ප්‍රධාන මුල්ගිරිගල පර්වතය හා තදාශ්‍රිත කලාපයන්හි ව්‍යාප්තව පවතින මෙම බෞද්ධ පුරාවිද්‍යාත්මක උරුමයන්හි වටිනාකම අධ්‍යයනය කිරීම වැදගත්වේ. මෙම පර්යේෂණයෙහි අරමුණ වී ඇත්තේ මුල්ගිරිගල රාජමහා විහාරභූමියෙහි ව්‍යාප්තව පවත්නා පුරා උරුමයන් අධ්‍යයනය කර වාර්තා ගතකරමින් එයට අනුව මුල් කාලීන විහාරය පැවති තත්වය විමසා බැලීමයි. ඒ සඳහා මෙම විහාර තදාශ්‍රිතයේ පැවති පුරාවිද්‍යා උරුමයන් වන විහාර භූ දර්ශනය, ලෙන් විහාර, සංඝාරාම, බෝධිය, චෛත්‍ය, ජල මූලාශ්‍රය, පැරණි ලේඛනයන්, සෙල්ලිපි, පිරිවෙණ, සඟපරපුර, චිත්‍ර, මූර්ති, කැටයම්, වාස්තු විද්‍යාංග පිළිබඳව අධ්‍යයනය කෙරේ. මෙහිදී ක්ෂේත්‍ර ගවේෂණය සහ ප්‍රාථමික මූලාශ්‍රයන් වන සම්මුඛ සාකච්ඡා සහ ද්විතික, තෘතීය මූලාශ්‍රයන් ලෙස සාහිත්‍ය ග්‍රන්ථ, පුරාවිද්‍යා වාර්තා, පර්යේෂණ ග්‍රන්ථ ඇසුරෙන් මෙම පුරා උරුමයන් වෙන වෙනම ගෙන එහි ඓතිහාසිකත්වය, කලාත්මක භාවය, තාක්ෂණය විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කෙරිණි. ඒ අනුව සියලුම දත්ත විශ්ලේෂණය කරමින් මෙහි උරුමයෙහි පුරාවිද්‍යාත්මක වැදගත්කම සහ ඒවායේ කාලනිර්ණයන් මෙන්ම ඓතිහාසික වැදගත්කම පිළිබඳ නිගමන මගින් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමි. මෙලෙස පුළුල්ව අධ්‍යයනය මඟින් මුල්ගිරිගල රජමහා විහාරය පෙර ආරම්භක යුගයෙහි ආරණ්‍ය සේනාසනයක් බවට පත්ව තිබී ඇති බව පැහැදිලි වේ.

**ප්‍රමුඛ පදඵ ආරණ්‍ය සේනාසනය මුල්ගිරිගල ලෙන් විහාර සෙල්ලිපි සංඝාරාම**

*1.* Info.harhas@gmail.com, *පුරා විද්‍යා අධ්‍යයන අංශයල කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. මහාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව* uhettige@yahoo.co.uk